IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2015/2016

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 මැයි)

# BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1.

1.1 ශ්‍රී ලංකාවට වඩාත්ම උචිත වන ආර්ථික ක්‍රමය කුමක්දැයි පැහැදිලි කර එය එසේ උචිත වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

1.2 සහස්‍ර සංවර්ධන ඉලක්ක හා තිරසාර සංවර්ධන ඉලක්ක පැහැදිලි කර තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

2.

2.1 විදේශ විනිමය ඉල්ලුමට හා සැපයුමට බලපාන සාධක සවිස්තරාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

2.2 විනිමය අනුපාත වෙනස් වියහැකි ක්‍රම 4 පැහැදිලි කර විනිමය අනුපාතය ඉහල යෑම ශ්‍රී ලංකාවට කෙසේ බලපාන්නේද යන්න විග්‍රහ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

3.

3.1 හැකිලෙන සුළු බදු ප්‍රතිපත්තිය හා විහිදෙන සුළු බදු ප්‍රතිපත්තිය සංසන්දනාත්මකව විග්‍රහ කර ශ්‍රී ලංකාවට සුදුසු බදු ප්‍රතිපත්තිය පිළිබඳව වර්තමාන බදු සංශෝධන සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

3.2 බදු ප්‍රතිපත්ති උපකරණ විස්තර කර 1977 පසු ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිවල සාර්ථකභාවය වර්තමාන බදු සංශෝධන සමඟ සමගාමීව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

4.

4.1 ශ්‍රී ලංකාවේ උද්ධමනය පාලනය කල හැක්කේ කෙසේදැයි පැහැදිලි කර ඒ සඳහා රජයට දායකවිය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

4.2 පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය කෙසේ ඇති වන්නේ දැයි පැහැදිලි කර එය පාලනය කිරීම කෙසේ කල හැකිදැයි වර්තමාන ප්‍රතිපත්ති සමඟ සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

5.

5.1 ශ්‍රී ලංකාවේ ජාතික පාරිභෝගික මිල දර්ශකය විස්තර කර එය කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

5.2 ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන වල බලපෑම වර්තමානයේ ගෙවුම් ශේෂ ලේඛනයට බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න. එය ජන ජීවිතයට කෙසේ බලපෑම් ඇති කරයිද යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

6.

6.1 විදේශ ආයෝජන ශ්‍රී ලංකාවේ සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කර විදේශ ආයෝජන ලබා ගැනීමට ශ්‍රී ලංකාව ගතයුතු ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 10)

6.2 ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති වලට අනුව ආදායම් වැඩිදියුණු කිරීමට ගනුලැබූ ක්‍රියා මාර්ග අසාර්ථක වීමට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

7.

7.1 ගෝලීයකරණය ඇතිවීමට හේතු වූ සියලුම කාරණා පැහැදිලි කර ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇතිවූ වාසි පැහැදිලි කර වර්තමාන ගෝලීයකරණ ප්‍රවනතාව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

7.2 නිදහසින් පසු අද දක්වා ශ්‍රී ලංකාවේ දුප්පත්කමේ උපනතිය විග්‍රහ කර දුප්පත් කම නැති කිරීම සඳහා ගනුලැබූ ප්‍රතිපත්ති කෙතරම් දුරට සාර්ථක වී ඇත්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

8.

8.1 ආර්ථික සංවර්ධන න්‍යායන්හි පරිණාමය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

8.2 ආර්ථික වර්ධනය තීරණය කරන ප්‍රධාන සාධක 5ක් විස්තර කරන්න.

(ලකුණු 05)

8.3 මෑතකාලීන ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගයෙහි උපනතිය හා ඊට බලපෑ සාධක පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

*******************************************